# තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව

සුරේන් ඩී. පෙරේරා
281,
ඩීන්ස් පාර,
කොළඹ 10

අභියාචක

අභියාචනා අංකය :
**RTIC Appeal/616/2022**

එදිරිව

ශ්‍රී ලංකා පොලීසිය
පොලිස් මූලස්ථානය
කොළඹ 01

පොදු අධිකාරිය

**ඉදිරිපිටදී** : 1. විනිසුරු උපාලි අබේරත්න (විශ්‍රාමික) - සභාපති
2. විනිසුරු රෝහිණී වල්ගම (විශ්‍රාමික) - කොමසාරිස්
3. නීතිඥ කිෂාලි පින්ටෝ ජයවර්ධන - කොමසාරිස්
4. නීතිඥ ජගත් ලියන ආරච්චි - කොමසාරිස්

**පෙනී සිටීම** : අභියාචක සිටී. අභියාචක වෙනුවෙන් මාධ්‍යවේදී තරිඳු ජයවර්ධන මයා සමග නීතිඥ මනුෂිකා කුරේ මිය පෙනී සිටී.
පොදු අධිකාරිය වෙනුවෙන් පොලිස් අධිකාරි, නීතිඥ වසන්ත පිටියකුඹුර මයා (නීති උපදේශන අංශය) පෙනී සිටී.

**ලිඛිත සැළකිරීම්** : අභියාචක - ඉදිරිපත් කර නැත.
පොදු අධිකාරිය - ඉදිරිපත් කර නැත.

**විභාග කළ දිනය** : 2022.09.15

**තීරණය කළ දිනය** : 2022.10.06

**කොමිෂන් සභාවේ තීරණය:**

**අභියාචනයට පසුබිම්වූ කරුණු**

අභියාචක විසින් 2021.11.20 දිනැති තොරතුරු ඉල්ලීම මඟින් පහත සඳහන් තොරතුරු ඉල්ලා ඇත.

*"1. ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ අත්අඩංගුවට ගත් පුද්ගලයන් අතරින් රැඳවුම් නියෝග මත රැඳවුම් භාරයේ සිටින,*

*1.1 සමස්ත පුද්ගලයන් සංඛ්‍යාව කොපමණද?*
*1.2 වයස අවුරුදු 18න පහළ /18-30 අතර/30-60 අතර/60ට ඉහල, යන වයස් කාණ්ඩ යටතේ සිටින පුද්ගලයන් සංඛ්‍යාව කොපමණද?*
*1.3 කාන්තා සහ පිරිමි පුද්ගලයන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද?*
*1.4 පුද්ගලයන්ගේ පදිංචිය අනුව එක් එක් දිස්ත්‍රික්කය යටතේ පදිංචි පුද්ගලයන් සංඛ්‍යාව කොපමණද?*
*1.5 ගර්භනී මව්වරුන් සංඛ්‍යාව කොපමණද?*
*1.6 මානසික (මනෝ) වෛද්‍ය ප්‍රතිකාර ලබන පුද්ගලයන් සංඛ්‍යාව කොපමණද?*
*1.7 වෛද්‍ය ප්‍රතිකාර ලබන පුද්ගලයන් සංඛ්‍යාව කොපමණද?*
*1.8 මාසයකට වඩා අඩු කාලයක් /මාස 1-3ත් අතර කාලයක් /මාස 4-6 අතර කාලයක් /මාස 7-9 අතර කාලයක් /මාස 10-12 අතර කාලයක්/මාස 13-15 අතර කාලයක් /මස 16-18 අතර කාලයක් /මාස 18 කට වඩා වැඩි කාලයක් රැඳවුම් භාරයේ සිටින පුද්ගලයන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද?*
*1.9 පුද්ගලයන් රඳවා තබා ඇති රැඳවුම් ස්ථාන කීයක් තිබේද? එම එක් එක් රැඳවුම් ස්ථානයේ සිටින ඉහත වර්ගයේ රැඳවියන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද?*

*2. ත්‍රස්තවාදය වැළක්වීමේ පනත යටතේ රදවාගෙන, 2019 ජනවාරි 01 වන දින සිට ඇප නොමැතිව (නියම නොකොට) සහ අධිචෝදනා ගොනු නොකර, නිදහස් කර ඇති,*

*2.1 සමස්ත පුද්ගලයන් සංඛ්‍යාව කොපමණද?*
*2.2 වයස අවුරුදු 18 න් පහළ /18-30 අතර/30-60 අතර/60ට ඉහල, යන වයස් කාණ්ඩ යටතේ සිටින පුද්ගලයන් සංඛ්‍යාව කොපමණද?*
*2.3 කාන්තා සහ පිරිමි පුද්ගලයන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද?*
*2.4 පුද්ගලයන්ගේ පදිංචිය අනුව එක් එක් දිස්ත්‍රික්කය යටතේ පදිංචි පුද්ගලයන් සංඛ්‍යාව කොපමණද?*
*2.5 ගර්භනී මව්වරුන් සංඛ්‍යාව කොපමණද?*
*2.6 පුද්ගලයන් අතරින් කී දෙනෙකු හට රැඳවුම් භාරයේ සිටින විට මානසික සෞඛ්‍ය රැකවරණය (මානසික සෞඛ්‍ය ප්‍රතිකාර) ලැබී තිබේද?*
*2.7 පුද්ගලයන් අතරින් කී දෙනෙකු හට රැඳවුම් භාරයේ සිටින විට ශාරීරික සෞඛ්‍ය රැකවරණය (සෞඛ්‍ය ප්‍රතිකාර) ලැබී තිබේද?*
*2.8 පුද්ගලයන් සංඛ්‍යාව, අත්අඩංගුවට ගත් දිනය හා නිදහස් කළ දිනය අතර කාල පරතරයන් අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද? (අවුරුදු 1ට අඩු/ අවුරුවු 1ත් -2ත් අතර/අවුරුදු 3ත් -5ත් අතර/ අවුරුදු 5ත් -10ත් අතර/ අවුරුදු 10ත් -15ත් අතර /අවුරුදු 15කට වැඩි)"*

(තොරතුරු වලට අදාළ කාල පරිච්ඡේදය: 2019 ජනවාරි 01 වන දින සිට 2021 නොවැම්බර් 20 දින දක්වා.)

තොරතුරු නිලධාරී විසින් 2021.11.27 දිනැතිව තොරතුරු ඉල්ලීම සම්බන්ධයෙන් පහත පරිදි ප්‍රතිචාර දක්වා ඇත.

> *".... තොරතුරු පනතේ 43 වන වගන්තියේ "තොරතුර" යන නිර්වචනය කර ඇත. ඔබ විසින් ඉල්ලා ඇති තොරතුරු එකී නිර්වචනයට අනුගත නොවන බැවින්, එම තොරතුරු ලබා දීමට හැකියාවක් නොමැති බව කාරුණිකව දන්වා සිටිමි."*

එකී ප්‍රතිචාරයෙන් අතෘප්තියට පත් 2021.12.13 වන දින නම් කළ නිලධාරී වෙත අභියාචනයක් යොමු කර ඇති අතර නම් කළ නිලධාරී විසින් 2022.01.09 දිනැතිව පහත පරිදි ප්‍රතිචාර දක්වා ඇත.

> *" ....2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් පිළිබඳ පනතේ 5 වන උපවගන්තියේ විධිවිධාන අනුව පහත සඳහන් කර ඇති හේතුව මත ප්‍රතික්ෂේප කර කරන ලද බව දන්වමි.*
>
> *i. 2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් පිළිබඳ පනතේ 5 (1) (ආ) (i) වගන්තිය."*

එකී ප්‍රතිචාරයෙන් ද අතෘප්තියට පත් අභියාචක 2022.03.08 දිනැතිව කොමිෂන් සභාව වෙත මෙම අභියාචනය යොමු කර ඇත.

**සළකා බැලීම**

ඉහත සඳහන් තොරතුරු ඉල්ලීම සම්බන්ධයෙන් පොදු අධිකාරියේ තොරතුරු නිලධාරී විසින් 2021.11.27 වන දිනෙන් යුතුව දක්වා ඇති ප්‍රතිචාරයෙහි ඔවුන් අදාළ කර ඇති ස්ථාවරය එනම්, ඉල්ලා ඇති තොරතුරු 2016 අංක 12 දරණ පනතේ 43 වගන්තියේ දැක්වෙන තොරතුර යන අර්ථනිරූපණය තුළට නොගැනේ යන නිගමනය සමග කිසිසේත් එකඟ විය නොහැක. අභියාචක විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් තොරතුරු ඉල්ලීමේ පැහැදිලි ලෙසම නිශ්චිත තොරතුරු සමූහයක් ඉල්ලා ඇත. ඒවා තොරතුරු නොවන බවට ගොඩනැගිය හැකි තර්කයන් තොරතුරු නිලධාරී විසින් ඉදිරිපත් කර නොමැති අතර එම ස්ථාවරය සනාථ කෙරෙන කිසිදු සැළ කිරීමක් අභියාචනා පරීක්ෂණයේදී පොදු අධිකාරිය විසින් ගෙන නොමැත.

තොරතුරු නිලධාරිගේ ස්ථාවරය එසේ තිබියදී අභියාචක විසින් පොදු අධිකාරියේ නම් කළ නිලධාරි වෙත ඉදිරිපත් කළ අභියාචනය සම්බන්ධයෙන් නම් කළ නිලධාරි විසින් එළඹ ඇති තීරණයෙහි තොරතුරු නිලධාරිගේ තීරණය සම්බන්ධයෙන් කිසිදු සැළකිල්ලක් දක්වා නොමැති බව පෙනී යයි. නම් කළ නිලධාරිගේ මූලික කාර්යය විය යුත්තේ තොරතුරු නිලධාරි එළඹ ඇති තීරණය තහවුරු කළ හැකිද තහවුරු කළ නොහැකිද යන ස්ථාවර දෙකෙන් එකකට පැමිණීම වුවත්, ඔහු තම කාර්යභාරය මුලුමනින්ම පසෙකලා, තොරතුරු නිලධාරිගේ තීරණය කිසිදු අයුරකින්වත් සළකා බැලීමක් සිදු නොකරමින් අභියාචක විසින් ඉල්ලා ඇති ඉහත සඳහන් තොරතුරු ඉල්ලීම 2016 අංක 12 දරණ පනතේ 5 (1) (ආ) (i) හි ව්‍යාතිරේක තුළට ගැනෙන බවට නිගමනය කරමින් තොරතුරු ඉල්ලීම ප්‍රතික්ෂේප කර ඇත.

මේ අනුව නම් කළ නිලධාරි සහ තොරතුරු නිලධාරි යන දෙදෙනා එකිනෙකට පටහැනි තීරණ දෙකක එල්බගෙන ඇත.

ඉහතින් සඳහන් තොරතුරු ඉල්ලීම, පොදු අධිකාරියේ නම් කළ නිලධාරි සඳහන් කරන අන්දමට පනතේ 5 (1) (ආ) (i) අනුව්‍යවස්ථාව තුළට ගැනෙන්නේ කුමන තොරතුරු ඉල්ලීමක් හේතු කොටගෙනද යන්න

පැහැදිලිව හේතු දක්වා නොමැත. ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ අත්අඩංගුවට ගත් පුද්ගලයන් අතරින් රැඳවුම් නියෝග මත රඳවා සිටින පුද්ගලයන්ගේ සංඛ්‍යාව, වත ගොත, ඔවුන්ගේ මානසික ස්වභාවය සහ වෛද්‍ය ප්‍රතිකාර ලබන සංඛ්‍යාව වැනි ඉහත සඳහන් තොරතුරු ඉල්ලීමෙහි අඩංගු කරුණු කිසිවක් ඉහත කී 5 (1) (ආ) (i) වගන්තියේ දැක්වෙන සීමාවන් තුළට නොගැනේ.

5 (1) (ආ) (i) වගන්තිය මෙසේ විධාන පමුණුවා ඇත. " රාජ්‍ය ආරක්ෂාව හෝ එහි භෞමික අඛණ්ඩතාවයට හෝ ජාතික ආරක්ෂාවට බරපතල ලෙස අගතිදායක වන අවස්ථාවක". තොරතුරු ලබා දීම ප්‍රතික්ෂේප කළ හැකි වන්නේ ඉල්ලා ඇති තොරතුර මෙම ස්ථාවරයට එරෙහි වන්නේ නම් පමණි. අප ඉහතින් සඳහන් කළ ලෙසට ඉල්ලා ඇති තොරතුරු අත්අඩංගුවට ගත් සංඛ්‍යාව, ඔවුන්ගේ වත ගොත, ගර්භනී මවුවරුන් සංඛ්‍යාව, ප්‍රතිකාර ලබන සංඛ්‍යාව හා ඒ හා සමාන වන කරුණු වන විට ඒවා රාජ්‍ය ආරක්ෂාව හෝ භෞමික අඛණ්ඩතාවයට බරපතල ලෙස අගතිදායක වන්නේ කුමන අයුරකින්ද යන්න අපට වටහා ගත නොහැක. පොදු අධිකාරියේ නම් කළ නිලධාරි තම තීරණයෙහි එම කරුණු පැහැදිලි කර නොමැති අතර අවම වශයෙන් ඒවා සළකා බැලීමක්වත් සිදු කර නොමැත.

එසේම ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ රඳවාගෙන 2019.01.01 දින සිට ඇප නොමැතිව සහ අධි චෝදනා ගොනු නොකර නිදහස් කර ඇති පුද්ගල සංඛ්‍යාව හා ඊට අදාළව ඉල්ලා ඇති ඉහත සඳහන් අභියාචකගේ තොරතුරු ඉල්ලීමේ 2 අයිතමයේ සඳහන් කොටසද, පෙර සඳහන් කළ පරිද්දෙන්ම රාජ්‍ය ආරක්ෂාවට හෝ එහි භෞමික අඛණ්ඩතාවයට බරපතල ලෙස අගතිදායක වන්නේ කෙසේද යන්න පොදු අධිකාරියේ නම් කළ නිලධාරි තම තීරණයෙහි සඳහන් කර නොමැත. අධි චෝදනා ගොනු කර අත්අඩංගුවට ගත් පුද්ගලයින් නිදහස් කරන්නේ නම්, පැහැදිලි ලෙසම එම පුද්ගලයින්ගෙන් වරදක් සිදු වී නොමැති බවට හෙළිදරවු වීමක් සිදු වන අතර එවැනි පුද්ගලයින් සමාජගත වීමෙන් කුමන ආකාරයකින්වත් ජාතික ආරක්ෂාවට හෝ භෞමික අඛණ්ඩතාවයට කිසිදු අගතියක් හෝ හානියක් සිදු විය නොහැක.

අපට පෙනී යන අන්දමට එවැනි තොරතුරු මුදා හැරීම ප්‍රශංසනීය කරුණු බවට පෙනී යන බැවින් සහ ඒ සඳහා ලැබෙන ප්‍රතිචාරයන් ඉතා යහපත් වන බැවින් එවන් පරිසරයක් ගොඩනගන වටපිටාවක් තුළ තොරතුරු මුදා හැරීම ප්‍රතික්ෂේප කිරීමට පොදු අධිකාරිය තීරණය කිරීම එවැනි වටපිටාවක් ගොඩනැගීමට එරෙහිව සිදු කරන කටයුත්තක් බවද පෙනී යයි.

මෙම අභියාචනා විමර්ශනයේදී විමසීම සඳහා පොදු අධිකාරිය වෙනුවෙන් සහභාගී වූ පොලිස් අධිකාරි, නීතිඥ වසන්ත පිටියකුඹුර මහතා සඳහන් කළේ තොරතුරු මුදා හැරීම ප්‍රතික්ෂේප කිරීම සඳහා ගෙන ඇති පොදු අධිකාරියේ තීරණය පොදු අධිකාරියේ ස්ථාවරය බවය. එම ස්ථාවරය පැහැදිලි කෙරෙන සැළ කිරීම් කිසිවක් ඉදිරිපත් නොවීය.

ඉහත සඳහන් සියලු කරුණු සළකා බලා ඉහත සඳහන් තොරතුරු ඉල්ලීම සම්බන්ධයෙන් අභියාචක විසින් ඉදිරිපත් කරන ලද අභියාචනයට නම් කළ නිලධාරි විසින් ප්‍රකාශ කරන ලද තීරණය ප්‍රතික්ෂේප කිරීමට තීරණය කරමු. අභියාචක විසින් ඉදිරිපත් කරන ලද 2021.11.20 දින දරණ ඉහත සඳහන් තොරතුරු ඉල්ලීමේ අන්තර්ගත සියලුම තොරතුරු 2022.10.28 වන දිනට ප්‍රථම, මෙම කොමිෂන් සභාවටද පිටපත් සහිතව, අභියාචක වෙත මුදා හැරීමට පොදු අධිකාරිය ක්‍රියා කළ යුතු බවට තීරණය කරමු.

කොමිෂන් සභාවේ මෙම තීරණයට අනුකූලව ක්‍රියා කිරීමට පොදු අධිකාරිය අපොහොසත් වන්නේ නම්, තොරතුරු නිලධාරිට සහ පොදු අධිකාරියට එරෙහිව 2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ 39 වගන්තිය ප්‍රකාරව නියමිත මහේස්ත්‍රාත් අධිකරණයෙහි නඩු පැවරීමට ක්‍රියාකළ යුතු බවට කොමිෂන් සභාව තීරණය කරයි.

කොමිෂන් සභාවේ මෙම තීරණය පොදු අධිකාරිය වෙත, තොරතුරු නිලධාරි වෙත සහ අභියාචක වෙත දන්වා යැවීමට  කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා මෙහෙයවනු ලැබේ.

මෙම අභියාචනය අවසන් කරනු ලැබේ.

..............................................................
විනිසුරු උපාලි අබේරත්න (විශ්‍රාමික)  - සභාපති

..............................................................
විනිසුරු රෝහිණී වල්ගම (විශ්‍රාමික) - කොමසාරිස්

...............................................................
නීතිඥ කිෂාලි පින්ටෝ ජයවර්ධන - කොමසාරිස්

................................................................
නීතිඥ ජගත් ලියන ආරච්චි - කොමසාරිස්